**සුරාබදු ආඥාපනත**

**අංක 05/2019 දරන සුරාබදු නිවේදනය**

සුරාබදු ආඥාපනතේ (52 වැනි අධිකාරය වූ) 4, 13 සහ 17 වන වගන්ති යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය, මංගල සමරවීර වන මම, 2019 සැප්තැම්බර් මස...27.. වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි,

(1) මුළු දිවයිනටම බලපවත්වන පරිදි, විදේශ මත්පැන් සිල්ලරට විකිණිය යුතු උපරිම සීමාව තොග ලීටර් 80 (අසූවක්) ක් විය යුතු බව, සහ

(2) එකී ආඥාපනතට අනුව නිකුත් කරන ලද අවසර පත්‍රයක් මත හැර මුළු දිවයිනටම බල පවත්වන පරිදි සද්භාවයෙන් යුතුව පෞද්ගලික පරිභෝජනය සහ භාවිතය සඳහා විදේශ මත්පැන් ප්‍රවාහනය සහ ළඟ තබා ගැනීම කළ යුතු උපරිම සීමාව තොග ලීටර් 80 (අසූවක්) විය යුතු බව,

මෙයින් නියම කරමි.

2015 දෙසැම්බර් 31 දිනැති අංක 1947/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ අංක 985 දරන සුරාබදු නිවේදනය මෙයින් අවලංගු කරනු ලැබේ.

මංගල සමරවීර,
මුදල් අමාත්‍ය

2019 සැප්තැම්බර් මස ..27.. වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.